## උපලේඛණය - 02 (අධ්‍යාපන සුදුසුකම්)

| සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය | | |
|---|---|---|
| ශ්‍රේණි පරාසය | විෂය | බඳවා ගැනීමේ දී සපුරාලිය යුතු අධ්‍යාපන සුදුසුකම් |
| 1-5 ප්‍රාථමික | ප්‍රාථමික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල /දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂ /සාමාන්‍ය උපාධියක් ලබා ඇති කලා උපාධිධාරියකු වීම<br>හෝ<br>කලා විෂය ධාරාව යටතේ සාමාන්‍ය/ විශේෂ උපාධියක් සමඟ උසස් පෙළ විභාගයේ දී සිංහල/දෙමළ විෂය හදාරා තිබීම<br>සහ<br>අ.පො.ස (සා.පෙළ) ගණිතය හා සිංහල/දෙමළ භාෂාව සමත්ව තිබිම. |
| 6-11 ශ්‍රේණි | ඉංග්‍රීසි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධියක්<br>හෝ<br>ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමඟ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මඟින් පිරිනමන ලද ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) දෙවසරක පූර්ණ කාලීන පාඨමාලාව සහ හය මසක පාසල් පාදක ගුරු පුහුණුව සම්පූර්ණ කර තිබීම<br>සහ<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. |
| | ගණිතය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී (භෞතීය විද්‍යාව) උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>සහ<br>අ.පො.ස.(උ/පෙළ) සඳහා සංයුක්ත ගණිතය විෂයයක් ලෙස හදාරා ඉන් සමත් වී තිබීම. |

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේදී/ විද්‍යාවේදී (කෘෂිකර්ම) ප්‍රථම උපාධිය ලබා තිබීම. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත විෂයයන් 03 එක්වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>1.භෞතික විද්‍යාව<br>2.රසායන විද්‍යාව<br>3. ජීව විද්‍යාව |
| | භූගෝල විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | සංගීතය (පෙරදිග) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන ප්‍රාසාංගික කලා උපාධි (සංගීතය) ලබා තිබීම,<br>හෝ<br>ප්‍රාසාංගික කලාව/ලලිත කලාව (සාමාන්‍ය) උපාධියක් ලබා, සංගීතය විෂය උපාධියෙහි එක් ප්‍රධාන විෂයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් සංගීතය විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | චිත්‍ර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන ප්‍රාසාංගික කලා (චිත්‍ර) උපාධියක් ලබා තිබීම<br>හෝ<br><br>ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා, චිත්‍ර විෂය උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් චිත්‍ර විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | ඉතිහාසය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉතිහාසය/පුරාවිද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>ඉතිහාසය/පුරාවිද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | පුරවැසි අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |

| | | |
|---|---|---|
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. |
| | දෙවන භාෂාවක් ලෙස (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |
| | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය<br><br>ව්‍යවසායකත්ව අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ව්‍යාපාර අධ්‍යයනය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය/ ගිණුම්කරණය/ප්‍රධාන විෂයක් ලෙස හදාරා විද්‍යාවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | මව්බස (සිංහල) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල භාෂාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ සිංහල භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | මව්බස (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක දෙමළ භාෂාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | බුද්ධ ධර්මය | පිළිගත් විශ්විද්‍යාලයක බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| 6-11 ශ්‍රේණි | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | පිළිගත් විශ්වවිද්‍යාලයක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම/ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් තිබීම .<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම උපාධියක් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් එක් වසරකට නොඅඩු සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| | නර්තනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනැමෙන ප්‍රසාංගික කලා උපාධි (නැටුම්) ලබා තිබීම.<br>හෝ<br>ප්‍රාසාංගික කලාව/ලලිත කලාව (සාමාන්‍ය) උපාධියක් ලබා, නැටුම් විෂය උපාධියේ එක් ප්‍රධාන විෂයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් නැටුම් විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br>සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම් පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |